331

RARE

# ශ්‍රී ලාංකික ජන සමාජය තුළ භාවිත වන ගුප්ත විද්‍යා ක්‍රමයන්හි සමාජයීය බලපෑම

එස්. ජී. කේ. ද සිල්වා

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ දර්ශනය පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| | 331 |
| වර්ග අංකය | |

2003 සැප්තැම්බර්

# නිබන්ධ සාරාංශය


ශ්‍රී ලාංකික ජන සමාජය තුළ භාවිත වන ගුප්ත විද්‍යා ක්‍රමයන්හි සමාජීය බලපෑම කවර ස්වරූපයක් ගනු ලබන්නේද? යන්න පිළිබඳව කරුණු විමර්ශණය කිරීම මෙම අධ්‍යයනයෙහි මූලික පරමාර්ථය වූ අතර එම බලපෑම යථෝක්ත ජන සමාජයෙහි ප්‍රගමනයට උපකාරී වන්නේ කෙසේද? යන්න මෙම අධ්‍යයනය සඳහා පර්යේෂණ ගැටළුව වශයෙන් යොදා ගැනුණි.

මෙම අධ්‍යයනය සඳහා ක්‍රමවේදය වශයෙන් ක්ෂේත්‍ර ගවේෂණයක් සිදු කරන ලද අතර එහිදී දත්ත රැස් කිරීමේ ප්‍රධාන ක්‍රම දෙකක් අනුගමනය කරන ලදී. එනම් ගුප්ත විද්‍යාධාරීන් සහ ඔවුන්ගේ සේවාවන් ලබා ගැනීමට පැමිණි සේවාලාභීන් සමග සිදු කරනු ලැබූ විධිමත් සහ අවිධිමත් සම්මුඛ සාකච්ඡා සහ ගුප්ත විද්‍යා ක්‍රම පවත්වනු ලබන අවස්ථාවන්හිදී ඒවා රාශියකට සම්බන්ධවීමෙන් ලද සහභාගි නිරීක්ෂණයයි. තව ද මෙම අධ්‍යයනයට අවශ්‍ය වූ ශාස්ත්‍රීය දැනුම ලබා ගැනීම සඳහා ශාස්ත්‍රීය ගවේෂණයක් ද සිදු කරන ලද අතර එහිදී මූලාශ්‍ර වශයෙන් මුද්‍රිත සහ අමුද්‍රිත ග්‍රන්ථ, පුවත්පත්, කෝෂ්ඨ ග්‍රන්ථ, සඟරා, පුස්කොළ පොත්, අත්පොත් ආදිය උපයෝගී කර ගන්නා ලදී.

මහින්දාගමනයට පෙර සිට වර්තමානය දක්වා ඉතිහාසය පිරික්සා බැලීමේදී ශ්‍රී ලාංකික ජන සමාජයෙහි ගුප්ත බලවේගත්, ඒ හා සමග අන්‍යෝන්‍ය ලෙස බැඳී පවතින ගුප්ත විද්‍යා ක්‍රමත් බොහෝ සේ ජනප්‍රිය වී ඇති බැව් පැහැදිළි වේ. වරින් වර ඉන්දියාව සහ වෙනත් රටවලින් මෙරටට පැමිණි විවිධ සංස්කෘතීන්ට අයත් විවිධ ජාතීන්ගෙන් බොහෝ බලගතු යැයි සැලකෙන ගුප්ත විද්‍යා ක්‍රම රාශියක් ලැබී ඇත. මෙම ගුප්ත විද්‍යා ක්‍රම බොහොමයක් ග්‍රන්ථාරූඪ නොවූ ඒවා වන අතර අතිශය රහසිගත ලෙස මුඛ පරම්පරාගතව පැමිණ ක්‍රමයෙන් අභාවයට පත්වූත්, එම තත්වයට පත්වෙමින් පවතින්නාවූත් ඒවායි. දැනට ශේෂ වී ඇති ප්‍රබල ගුප්ත විද්‍යා ක්‍රම සමහරක් වසර ගණනාවක් පැරණි පුස්කොළ ග්‍රන්ථ වලින් ලබාගෙන තිබේ.

සමාජය තුළ මුල් බැස ගන්නා ඕනෑම සංකල්පයක් හට එයටම විශේෂ වූ ආරම්භයක්, පරිණාමයක් හා පැවැත්මක් ඇත. සමාජය තුළ එම සංකල්පයේ පැවැත්ම සහ භාවිතවීමේ ප්‍රවනතාවය එහි ආරම්භයේ සහ පරිණාමයේ ප්‍රබලතාව මත රඳා පවතී. ශ්‍රී ලාංකික ජන සමාජය තුළ ගුප්ත බලවේගයන්හි පැවැත්ම ඉතා ඈත අතීතය දක්වා ගමන් කරන බව ඒවා පිළිබඳ කරුණු සඳහන් විවිධ ඓතිහාසික මූලාශ්‍ර වලින් පැහැදිළි වේ. ගුප්ත විද්‍යා ක්‍රම ජන සමාජය තුළ ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වූයේ මනුෂ්‍යයාගේ එදිනෙදා ජීවිතයේ පැන නගින ගැටලු රාශියකට විසඳුම් එමගින් ලබාදීමට හැකි වී තිබෙන බැවිනි. ශ්‍රී ලාංකික ජන සමාජය තුළ ගුප්ත බලවේගයන්හට ඉතා වැදගත් ස්ථානයක් හිමි වී ඇති අතර ගුප්ත බලවේගයන් උපයෝගී කර ගනිමින් සිදු කරනු ලබන ගුප්ත විද්‍යා ක්‍රම ද ඒ හා සමානවම වැදගත් ස්ථානයක් හිමි කර ගන්නා බව පැහැදිලි වේ.

ගුප්ත විද්‍යා ක්‍රමයන්ට ආවේනික වූ ගුප්ත හා රහස්‍යභාවය නිසා ඕනෑම පුද්ගලයෙකුහට තම අතිශය පෞද්ගලික අභිමතාර්ථයන් පවා කිසිදු කෙනෙකුට දැනගත නොහැකි වන සේ ගුප්ත විද්‍යා ක්‍රම මගින් රහසිගතව සපුරා ගැනීමේ හැකියාවක් තිබීම සුවිශේෂත්වයකි. ගුප්ත විද්‍යා ක්‍රම මනුෂ්‍යයාට හිතකර සහ අහිතකර යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකි අතර මනුෂ්‍යයාට අහිතකර ගුප්ත විද්‍යා ක්‍රම මගින් සමාජයේ යහපත් පැවැත්මට හානි පැමිණවිය හැකි දරුණු අපරාධ පවා සිදු කළ හැකිවේ.

වර්තමාන ශ්‍රී ලාංකික ජන සමාජය තුළ ද ගුප්ත විද්‍යා ක්‍රම බහුලව භාවිතවීම දැකිය හැකි අතර බොහෝ දෙනා තම ජීවිතය හා සම්බන්ධ විවිධ ප්‍රශ්න සඳහා විසඳුම් සොයා ගැනීමට ගුප්ත විද්‍යා ක්‍රමයන්හි පිහිටාධාරය සොයා යති.

මේ අතර දියුණු තාක්ෂණයත් සමග ම ගුප්ත විද්‍යා ක්‍රමයන්හි යම් යම් වෙනස්කම් ඇති වී තිබේ සමාජයක සිදු වන වෙනස්වීම් සමගම එහි මුල් බැසගෙන තිබෙන්නා වූ විශ්වාස, ඇදහීම්, පුද පූජා ආදිය ද යම් ආකාරයක වෙනස්වීමකට භාජනය වේ. වත්මන් ශ්‍රී ලංකාවේ විවිධ සමාජ මට්ටම් නියෝජනය කරන්නන් ගුප්ත විද්‍යා ක්‍රම භාවිත කිරීමට නැඹුරු වී ඇති අතර ගුප්ත විද්‍යා ක්‍රම මගින් සේවා සපයන බොහෝ ගුප්ත විද්‍යාධාරීන් ද තම සේවාවන් මුදල් ඉපයීම ප්‍රධාන කොට ගත් ව්‍යාපාරයක් සහ

රැකියා මාර්ගයක් ලෙසින් පවත්වාගෙන යාමට පෙළඹී ඇත. ඔවුහු බොහෝ දෙනෙක් විවිධ මාධ්‍යය හරහා තම සේවාවන්හට විශාල ප්‍රචාරයක් ලබාදීමට ද උත්සාහ කරති. ඇතැම්හු විදේශ රටවල ජීවත් වන සේවාලාභීන් සමග ද ගනු දෙනු පවත්වති. මේ සඳහා නවීන සන්නිවේදන උපක්‍රම භාවිත කෙරේ.

ගුප්ත විද්‍යා ක්‍රම මගින් සේවා සැපයීම පිළිබඳව සලකා බලන කල්හි එම සේවාවන්ගේ තත්වය සහ ඒවායේ ප්‍රතිඵලයන්හි සාර්ථකභාවය පිළිබඳව නිසියාකාර ප්‍රමිතියක් නොමැති බැවින් වංචනිකයන් සහ අපරාධ කරුවන්ට ද මේ අතරට පැමිණීමට හැකි අවකාශ පුළුල් වී තිබේ. මේ අතර ඇතැම් ගුප්ත විද්‍යාධාරීන් විසින් ගුප්ත විද්‍යා ක්‍රම භාවිත කොට විවිධ අපරාධ කිරීමට ද නැඹුරු වී ඇති බැව් පුවත්පත් වැනි මුද්‍රිත මාධ්‍යයන්හි පළ වන ලිපි මගින් පැහැදිළි වේ.

ගුප්ත බලවේග උපයෝගී කොට ගෙන ගුප්තවිද්‍යාධරයින් විසින් සිදු කරනු ලබන ගුප්ත විද්‍යා ක්‍රම රාශියක් ශ්‍රී ලාංකික ජන සමාජය තුළ අතීතයේ සිට පැවතුණු බවත්, ශ්‍රී ලාංකික ජන ජීවිතයේ සෑම කටයුත්තකදීම ගුප්ත විද්‍යා ක්‍රම යොදා ගත් බවත් පැහැදිළි වන අතර වර්තමානයේදී ද ගුප්ත විද්‍යා ක්‍රම බොහෝ දෙනා අතර විශ්වාසයට සහ ජනප්‍රියතාවයට පත්වී ඇති බව පෙනී යයි. ගුප්ත විද්‍යා ක්‍රම මගින් සමාජයට හිතකර මෙන්ම අහිතකර ක්‍රියා ද සිදුවන බව පිළි ගත හැකි අතර පැහැදිළිව බාහිරට නොපෙනුනත් ගුප්ත විද්‍යා ක්‍රම මගින් සමාජයට විශාල බලපෑමක් ඇති කරනු ලබන බැව් ඒ පිළිබඳව හොඳින් අධ්‍යයනය කිරීමෙන් ලබා ගත හැකි දැනුම අනුසාරයෙන් නිගමනය කළ හැකිවේ.

1 - JUL 200